# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## තනතුරු ඇබෑර්තු - 2026

### කළමනාකරණ සහකාර තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ පුරප්පාඩු වී ඇති කළමනාකරණ සහකාර තනතුරු (කොන්ත්‍රාත් පදනම මත) සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2026.04.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **සුදුසුකම් :**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.
   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
   iii. ගණිතය

සහ

2. අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරක දී විෂයයන් තුන ම (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබිය යුතු ය.

**පහත සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

අ). පිළිගත් ආයතනයකින් පරිගණක යෙදවුම් සම්බන්ධයෙන් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක් සඳහා ලබා ගන්නා ලද පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

සහ

ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම.

- **තේරීම** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්
- **වැටුප :** රු. 44,662/= (මාසික) (2026.01.01 දිනට).
  මීට අමතරව රජය මගින් අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- **කාලය** - මාස 06 (විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය මත මාස 06න් 06ට නව පත්වීමක් ලෙස උපරිම වසර 02ක් දක්වා කාලය දීර්ඝ කළ හැකිය)

**සටහන :**

a. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
b. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.
c. මනා චරිතයක් තිබිය යුතු ය.

**<u>ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ</u>**

- තනතුරට පත් කිරීමෙන් පසු අදාළ තනතුරට හිමි මාසික වැටුපෙන් සේවා දායකයාගෙන් 10% හා සේවා යෝජකයා විසින් 15% මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථ සාධක අරමුදලට දායක කරනු ඇත. තවද සේවා යෝජකයා විසින් මාසික වැටුපෙන් 3% කට සමාන මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.

**<u>අයදුම් කළ යුතු ආකාරය:</u>**

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත සමඟ සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් ද සහිත ව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම් කරනු ලබන තනතුර පැහැදිලි ව සඳහන් කර 2026.04.30 දින හෝ ඊට පෙර, නියෝජ්‍ය ලේඛකාධිකාරී(පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 37, මොරගහහේන පාර, පිටිපන නගරය, හෝමාගම. යන ලිපිනය වෙත එවීම හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරී කාර්යාලය වෙත ගෙනැවිත් භාර දීම කළ යුතු ය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපැහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 37, මොරගහහේන පාර,**
**පිටිපන නගරය,**
**හෝමාගම.**
**2026.04.20**